## 4. ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය

### 4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 4.2 විගණන සාක්ෂි නොවීම

"දොළුව පුරාණය හා අම්බුළුවාව" නැමති ග්‍රන්ථයේ පිටපත් 2000 මුද්‍රණයෙන් පසු බෙදා දුන් ආකාරය සහ ඉතිරි ප්‍රමාණයන් පිළිබඳවත්, 2014 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී පැවති විශේෂ රැස්වීම් හා සාකච්ඡාවන් පිළිබඳ සාක්ෂි අග්‍රාමාත්‍ය කාර්යාලයේ නොතිබීම නිසා එකතුව රු.1,636,825 කට අදාල ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 4.3 විසර්ජන ගිණුම

#### 4.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් දෙකක් සඳහා රු.821,250 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 59 හා සියයට 92ක් විය.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 10 කට සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,438,229 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

### 4.4 අනුකූල නොවීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ, මුදල් රෙගුලාසි 109 ප්‍රකාර සිදුවන පාඩු (වාහන අනතුරු) පොත්වලින් ඉවත් කිරිමේදී අතිරේක ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමක් අවශ්‍ය නොවූවද, 2014 දෙසැම්බර් 24 දිනැති අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම් අංක 588 මගින් රු.672,800 අතිරේක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි.

### 4.5 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර එකතුව රු.195,000 ක් වටිනා, ස්ටිකරයක් සහිත ඔරලෝසු 250 ක් හා රු.2,289,850 ක් වටිනා අටපිරිකර හා සිවුරු පිරිකර මිලදී ගෙන තිබුණි.

**4.6** **අනාර්ථික ගනුදෙනු**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ ව්‍යාපෘතියක් වූ ආකල්ප වර්ධන වැඩසටහන යටතේ 2014 මාර්තු 08 දින සිට 2014 සැප්තැම්බර් 10 දින දක්වා කාලය තුළ පැවැත්වීමට සැලැසුම් කර තිබුණු ජන මාධ්‍ය සඳහා කාටූන් සජීවිකරණ වැඩසටහනට වෙනුවෙන් රු.11,050,888 ක් වැය කර තිබුණි. 2014 ජූලි 08 වන දිනැති අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ සටහන අනුව 2014 ජූලි 31 වන දින සිට එය නිෂ්ඵල කාර්යයක් ලෙස සළකා අත්හිටුවා තිබුණි.

**4.7** **මානව සම්පත් කළමනාකරණය**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 13 | 05 |
| (ii) තෘතියික මට්ටම | 10 | 10 | - |
| (iii) ද්විතියික මට්ටම | 68 | 67 | 01 |
| (iv) ප්‍රාථමික මට්ටම | 94 | 89 | 05 |
| එකතුව | 190 | 179 | 11 |